**ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය**

**11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය**

**2027 ජනවාරි 17 – 23**

**හෝමාගම, දියගම මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණයේ දී.**

=================================================================

## මූලික තොරතුරු

11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය වික්‍රමාන්විත අත්දැකීම්, නව දැනුම සහ ජාත්‍යන්තර මිත්‍රත්වය ගොඩනැගීම යනාදි අරමුණු පෙරදැරි කරගනිමින් දිවයින පුරා මෙන්ම ලොව පුරා සිටින බාලදක්ෂයින් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට නියමිතව ඇත.

- ජම්බෝරි කාල සීමාව : 2027 ජනවාරි 17 සිට 23 දින දක්වා
- ජම්බෝරිය සඳහා පැමිණීමේ දිනය : 2027 ජනවාරි 17
- ජම්බෝරියෙන් පිටත්වීමේ දිනය : 2027 ජනවාරි 23
- ස්ථානය : මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය, දියගම

විවිධ ක්‍රියාකාරකම් සහ එළිමහන් කඳවුරු බැඳීම් සඳහා පහසුකම් සහිතව පුළුල් භූමි ප්‍රදේශයක් පුරා විහිදී ඇති මෙම කඳවුරු භූමිය දැවැන්ත බාලදක්ෂ ක්‍රියාකාරකම් පුරෝගාමී ව්‍යාපෘති සහ සංස්කෘතික හමුවීම් සඳහා ඉතා යෝග්‍ය පරිසරයක් නිර්මාණය කරනු ලබයි.

## කාලගුණය පිළිබඳ පුරෝකථනය

ජනවාරි මාසය ශ්‍රී ලංකාවේ නිරිතදිග කලාපයට වියළි කාලගුණයක් පවතින කාලසීමාව වන අතර, එය කඳවුරු බැඳීම් සහ බාලදක්ෂ ක්‍රියාකාරකම් සඳහා හිතකර එළිමහන් පරිසරයක් සහිත කාලසීමාවකි.

- **උෂ්ණත්ව පරාසය**: දිවා කාලයේ උෂ්ණත්වය සාමාන්‍යයෙන් 27°C සහ 31°C (80°F - 88°F) අතර පවතියි. සවස් කාලයේ දී උෂ්ණත්වය 22°C සහ 23°C (72°F - 74°F) පමණ දක්වා පහත වැටෙමින් සුව පහසු මට්ටමක පවතියි.
- **වර්ෂාපතනය**: කාලගුණික දත්ත වලට අනුව ජනවාරි මාසය හෝමාගම ප්‍රදේශයට, සාපේක්ෂව අඩු වර්ෂාපතනයක් සහිත, වියළි මාස වලින් එකකි. එමෙන්ම දිගු වේලාවක් පවතින වැසි ඇතිවීමේ සම්භාවිතාව ද ඉතා අඩු ය. කිසියම් වැසි වාරයක් ඇති වුව ද, ඒවා සාමාන්‍යයෙන් ඉතා කෙටි කාලීනවේ.
- **හිරු එළිය සහ ආර්ද්‍රතාවය**: සහභාගිවන්නන්ට බස්නාහිර පළාතේ සාමාන්‍ය මධ්‍යස්ථ ආර්ද්‍රතා මට්ටම් සමඟ සතිය පුරා ප්‍රමාණවත් හිරු එළියක් අපේක්ෂා කළ හැකිය.

***විශේෂ අවධානයට*** *- මේ වන විට ලෝකය පුරා උද්ගතව ඇති එල්නිනෝ හි බලපෑමට ලක්වන රටවල් අතරින් එකක් ලෙස ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇත. ඒ අනුව එල්නිනෝ හි බලපෑම මත ඉහත සඳහන් කාලගුණික හා දේශගුණික පුරෝකථනයන් වෙනස් විය හැකි අතර කලානුරූපීව දේශීය හා ජාත්‍යන්තර පුරෝකථනයන් පදනම් කරගනිමින් මේ සම්බන්ධයෙන් 11 වන ජාතික ජම්බෝරි ලේකම් කාර්යාලය මගින් වරින් වර නිවේදන නිකුත් කිරීම සිදු කරනු ඇත.*

## ජම්බෝරි ක්‍රියාකාරකම්

බාලදක්ෂයෙකුගේ පුද්ගල සංවර්ධනයේ සෑම අංශයක් ම ආවරණය වන පරිදි ඉලක්කගත අංශ 5ක් ඔස්සේ ජම්බෝරි ක්‍රියාකාරකම් නිර්මාණය කර ඇත.

🌍 **ගොඩබිම ආශ්‍රිත ක්‍රියාකාරකම් (පෘථිවිය):** අභියෝග සඳහා මුහුණදීමේ කුසලතා, පරිසරය රැකගැනීම, සහ සොබාදහම ගවේෂණය.

🌊 **ජලය:** ජලාශ්‍රිත ක්‍රියාකාරකම්, ජල සම්පත ආරක්ෂාව සහ වෙරළ සංරක්ෂණය

✈ **ගුවන:** කඹ ආශ්‍රිත ක්‍රියාකාරකම්, ගුවන් ක්‍රීඩා සහ පියාසර විද්‍යා මොඩියුල

🚀 **අනාගත ලෝකය:** STEM නවෝත්පාදන, ඩිජිටල් පුරවැසිභාවය, රොබෝ විද්‍යාව සහ තිරසාර තාක්ෂණය.

🕊 **අධ්‍යාත්මිකත්වය :** සාමය ගොඩනැගීම, සතිමත්භාවය, ඇදහිලි සහ විශ්වාස, අන්තර් සංස්කෘතික සංවාද සහ ප්‍රත්‍යාවේක්ෂණය

**එමෙන්ම, එරීනා සංදර්ශන, සංස්කෘතිකාංග, සංගීත ප්‍රසංග, අධ්‍යාපනික ප්‍රදර්ශන, ප්‍රජා සේවා ව්‍යාපෘති හා විවිධ ත්‍රාසජනක අත්දැකීම් ඇතුළත්ව** සෑම සහභාගි වන්නෙකුටම 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය තුළින් අද්විතීය අත්දැකීමක් ලබා දීමට අපේක්ෂා කරයි.

## දෛනික සංදර්ශන

සෑම දිනකම සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය ප්‍රාසාංගික කලාව සහ නවීන නිර්මාණ එකිනෙක සම්මිශ්‍රණය කරමින් ඉදිරිපත් කෙරෙන රාත්‍රී සංදර්ශනයන් හා ප්‍රසංග ඇතුළු විවිධ විනෝදකාමී අත්දැකීම් ලබාදෙන වැඩසටහන් ජම්බෝරි සතිය පුරාවටම ක්‍රියාත්මක වීමට නියමිතය.

එමෙන්ම, ගෝලීය විවිධත්වය අගය කරමින් සංස්කෘතික දිනය, ජාත්‍යන්තර සංස්කෘතික රාත්‍රී වැඩසටහන, විවිධ දේශීය සම්ප්‍රදායන් සැමරීම සඳහා විවිධ වැඩසටහන් මෙන්ම ලෝක බාලදක්ෂ මධ්‍යස්ථානය සම්බන්ධ වන වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## විශේෂ වැඩසටහන්

බාලදක්ෂ නායකයින්ගේ හමුව, ගිල්වෙල් සාමාජිකයන්ගේ හමුව, ATAS සාමාජිකයන්ගේ සුහද හමුව වැනි වැඩසටහන් තුළින් මනා සබඳතා හා මිත්‍රත්ව ජාලයක් ගොඩනගා ගැනීමට අවස්ථාව සලසා දෙනු ලබයි.

## බාලදක්ෂ ක්‍රියාකාරකම්

බාලදක්ෂ ක්‍රියාකාරකම් පහත සඳහන් අංශ ඔස්සේ පුළුල් පරාසයක ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- අභියෝගාත්මක ක්‍රියාකාරකම් කලාපය
- ජලාශ්‍රිත ක්‍රියාකාරකම් කලාපය
- ගුවන් ගවේෂණ ක්‍රීයාකාරකම්
- ජම්බෝරි ප්‍රදර්ශනය
- ආගමික හා සංස්කෘතික වැඩසටහන්
- නවෝත්පාදන ප්‍රදර්ශනය
- කඳවුරු ගිනිමැල



65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk

**බාහිර ගවේෂණ**

කඳවුරු භූමියෙන් බැහැර ප්‍රදේශය ආශ්‍රිතව ජෛව විවිධත්වය හා සංස්කෘතිය ගවේෂණය කිරීම සඳහා:

- ○ සංස්කෘතික ස්ථාන නිරීක්ෂණය
- ○ පරිසර නිරීක්ෂණ ක්ෂේත්‍ර චාරිකා

**ප්‍රජා සේවා ව්‍යාපෘති**

තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් වන අයුරින් සැලසුම් කර ඇති අර්ථවත් ප්‍රජා සේවා ව්‍යාපෘති, ජනාධිපති කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබන Clean Sri Lanka ජාතික ක්‍රියාන්විතය සමග අත්වැල් බැඳගනිමින් විවිධ ප්‍රදේශ කේන්ද්‍ර කර දියත් කිරීමට අපේක්ෂා කරති.

**ආරක්ෂාව, කායික හා මානසික සෞඛ්‍යය සහ සුරක්ෂිතතාව**

11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරියේ දී සියලු ම සහභාගි වන්නන්ගේ ආරක්ෂාව, කායික හා මානසික සෞඛ්‍යය සහ යහපැවැත්මට ප්‍රමුඛස්ථානය ලබා දෙනු ලැබේ. එහි දී ලෝක බාලදක්ෂ ව්‍යාපාරයේ '**හානියෙන් සුරක්ෂා**' (Safe from Harm) ප්‍රතිපත්තිය, පුළුල් ළමා ආරක්ෂණ පියවර සහ කඳවුරු භූමියේ සියලුම ක්‍රියාකාරකම් හා පහසුකම් ආවරණය වන පරිදි සිදු කෙරෙන අවදානම් කළමනාකරණ ඇගයීම් හරහා ආරක්ෂිත සහ සුරක්ෂිත පරිසරයක් ඇති කිරීම සඳහා කටයුතු යොදා ඇත. එමෙන්ම, හදිසි අවස්ථාවක දී ක්ෂණිකව ක්‍රියාත්මක වීම සඳහා පැය 24 පුරා ක්‍රියාත්මක වන ජම්බෝරි රෝහලක්, ගිලන්රථ පහසුකම් සහ වෘත්තීය ගිනි නිවන සේවාවක් කඳවුරු භූමිය තුළ ස්ථාපනය කර ඇත.

*ජම්බෝරි භූමිය ඇතුලත හා පිටත දේශීය හා විදේශීය බාලදක්ෂයින් කටයුතු කිරීමේ දී විශේෂිත ආරක්ෂක වැඩපිලිවෙලක් ආරක්ෂක අංශ සමග සාකච්ඡා කර සූදානම් කර ඇත.*

**දිසා කණ්ඩායම් ලියාපදිංචිය**

**බාලදක්ෂ අංශය**

- **සහභාගී වන්නන්ගේ වයස:** සුදුසුකම්ලත් බාලදක්ෂයින් 2026 සැප්තැම්බර් 30 වන දින වන විට අවම වශයෙන් වයස අවුරුදු 11 සම්පූර්ණ කර තිබිය යුතු අතර වයස අවුරුදු 18 ට අඩු විය යුතුය.
- **සුදුසුකම්:** 2026 සැප්තැම්බර් 30 වන දිනට පෙර බාලදක්ෂ ප්‍රදානය (Scout Award) ලබාගෙන ඇති කනිෂ්ඨ හෝ ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින් 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරියට ලියාපදිංචි කිරීමට දිසා වලට හැකියාව ඇත.
- **කණ්ඩායම් ප්‍රමාණය:** බාලදක්ෂයන් හෝ බාලදක්ෂ බාලිකාවන් 50 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් වශයෙන් ලියාපදිංචි කිරීම සිදු කළ යුතුය.
- **ඒකක නායකයින්:** බාලදක්ෂයන් හෝ බාලදක්ෂ බාලිකාවන් 50 දෙනෙකුගෙන් යුත් එක් එක් කණ්ඩායම සඳහා අධිකාරීපත්‍රලාභී බාලදක්ෂ නායකයන් / නායිකාවන් ඒකක නායකයින් (Unit Leaders) ලෙස අනියුක්ත කළ යුතු අතර එවැනි කණ්ඩායමක් සඳහා ඒකක නායකයන් අවම වශයෙන් 2 දෙනෙකු හෝ උපරිම වශයෙන් 5 දෙනෙකු ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතුය.



65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk

- **එක් එක් දිසාව සඳහා වෙන් කරන ලද ප්‍රමාණය:**

| දිසාව | දිසා කණ්ඩායමට ඇතුලත් විය හැකි සංඛ්‍යාව | ඒකක ගණන (එක් කණ්ඩායමට බාලදක්ෂයින් 50 බැගින්) | කණ්ඩායම් නායකයින්ගේ අවම සංඛ්‍යාව | කණ්ඩායම් නායකයින්ගේ උපරිම සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අක්/කල්මුණේ | 400 | 8 | 16 | 40 |
| අම්පාර | 50 | 1 | 2 | 5 |
| අනුරාධපුරය | 150 | 3 | 6 | 15 |
| අවිස්සාවේල්ල | 100 | 2 | 4 | 10 |
| බදුල්ල | 400 | 8 | 16 | 40 |
| මඩකලපුව | 350 | 7 | 14 | 35 |
| හලාවත | 50 | 1 | 2 | 5 |
| කොළඹ | 1,300 | 26 | 52 | 130 |
| ගාල්ල | 400 | 8 | 16 | 40 |
| ගම්පහ | 450 | 9 | 18 | 45 |
| හම්බන්තොට | 300 | 6 | 12 | 30 |
| හෝමාගම | 400 | 8 | 16 | 40 |
| යාපනය | 300 | 6 | 12 | 30 |
| කළුතර | 400 | 8 | 16 | 40 |
| මහනුවර | 1,100 | 22 | 44 | 110 |
| කන්කසන්තුරේ | 200 | 4 | 8 | 20 |
| කෑගල්ල | 250 | 5 | 10 | 25 |
| කිලිනොච්චිය | 350 | 7 | 14 | 35 |
| කුරුණෑගල | 600 | 12 | 24 | 60 |
| මන්නාරම | 100 | 2 | 4 | 10 |
| මාතලේ | 100 | 2 | 4 | 10 |
| මාතර | 400 | 8 | 16 | 40 |
| මොණරාගල | 200 | 4 | 8 | 20 |
| මො/පිළියන්දල | 250 | 5 | 10 | 25 |
| මුලතිව් | 50 | 1 | 2 | 5 |
| නාවලපිටිය | 50 | 1 | 2 | 5 |
| මීගමුව | 250 | 5 | 10 | 25 |
| නුවරඑළිය | 150 | 3 | 6 | 15 |
| පානදුර/හොරණ | 300 | 6 | 12 | 30 |
| පේදුරුතුඩුව | 100 | 2 | 4 | 10 |
| පොලොන්නරුව | 100 | 2 | 4 | 10 |
| පුත්තලම | 50 | 1 | 2 | 5 |
| රත්නපුර | 350 | 7 | 14 | 35 |
| ත්‍රිකුණාමලය | 150 | 3 | 6 | 15 |
| වවුනියාව | 200 | 4 | 8 | 20 |
| වත්තල / ජා-ඇල | 400 | 8 | 16 | 40 |
| වෙන්නප්පුව | 50 | 1 | 2 | 5 |
| එකතුව | **10,800** | **216** | **432** | **1,080** |



65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk

- **දිසා කණ්ඩායම් කළමනාකරණ කමිටුව (District Contingent Management Team):**

  එක් එක් දිසාවන් විසින් පහත තනතුරු සඳහා නායකයින් පත් කළ යුතුය:

  - **දිසා කණ්ඩායම් අනුශාසක (දිසා කොමසාරිස්) (District Contingent Adviser)**
  - **දිසා කණ්ඩායම් නායක (District Contingent Leader)**
  - **නියෝජ්‍ය දිසා කණ්ඩායම් නායක (Deputy Contingent Leader)**
  - **ලියාපදිංචි කිරීමේ දිසා නිලධාරී (Registration System Administrator)**

## ලියාපදිංචිය සහ ගාස්තු

- **ලියාපදිංචි ගාස්තුව:** රුපියල් 2,500 කි. (බාලදක්ෂයින් / බාලදක්ෂ බාලිකාවන්, ඒකක නායකයින් සහ දිසා කළමනාකරණ කමිටුව සඳහා)
- **ලියාපදිංචියේ දී හිමිවන දේ:** සියලුම දෙනාට ජම්බෝරි ක්‍රියාකාරකම් සඳහා පූර්ණ සහභාගීත්වය, අනන්‍යතාවය තහවුරු කිරීමේ අත් පළඳනාව (wristband ID), ජම්බෝරි කරලේන්සුව, ක්‍රියාකාරකම් අත්පොත (passport), ජම්බෝරි පරිගණක හෝ ජංගම දුරකථන යෙදුම් ප්‍රවේශය (app), සහභාගීත්ව සහ ක්‍රියාකාරකම් සහතිකපත්, ජම්බෝරි පදක්කම (badge), ක්‍රියාකාරකම් නිම කිරීමේ ප්‍රදානය (Activity Award) ලැබෙනු ඇත.
- **ගෙවීම් ක්‍රියාවලිය:** උපදෙස්වලට අනුකූලව ලියාපදිංචිය සම්පූර්ණ කිරීමෙන් පසු ගෙවීමට ඇති සම්පූර්ණ ලියාපදිංචි ගාස්තුව එක් කුවිතාන්සියක් ලෙස දිසා වලට යොමු කරනු ලැබේ. මෙම ලියාපදිංචි මුදල ***පාසල් සංවර්ධන සමිති අරමුදල හෝ සමූහ ආධාර කමිටුව මගින්*** ලබාගැනීමට දිසා වලින් කටයුතු කළ යුතුය.
- **ජම්බෝරි ප්‍රවේශ පත්‍ර:** ලියාපදිංචි වීම, ගමන් වියදම් හා කඳවුරු වියදම් පියවා ගැනීමට බාලදක්ෂයන්ට සහාය වීම සඳහා "ජම්බෝරි ප්‍රවේශපත්‍ර" (Jamboree Entrance Ticket) අරමුදල් රැස් කිරීමේ වැඩසටහනක් මේ යටතේ දියත් කිරීමට නියමිතය. මෙම වැඩසටහන පිළිබඳ සවිස්තරාත්මක චක්‍රලේඛයක් සැප්තැම්බර් මස පළමු සතිය තුළ නිකුත් කිරීමට කටයුතු කෙරේ. මෙම ප්‍රවේශපත්‍ර පාසල් සංවර්ධන සමිති අරමුදල හෝ සමූහ ආධාර කමිටුව මගින් බෙදා හැරීමට දිසා වලින් කටයුතු කළ යුතුය.



65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk

## 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය (National Scout Jamboree) සඳහා ලියාපදිංචි වීමේ උපදෙස්

***ලියාපදිංචි වීමට පෙර පහත උපදෙස් හොඳින් කියවා ලියාපදිංචිය සිදු කිරීමට කටයුතු කරන්න.***

### 1. දිසා පරිපාලක ගිණුම

පෙර නම් කරන ලද ලියාපදිංචි කිරීමේ දිසා නිලධාරී වෙත පහත තොරතුරු ලැබෙනු ඇත.

- ***පිවිසුම් සබැඳිය (login link)***
- ***පරිශීලක නාමය (Username)***
- ***මුරපදය (Password)***

මෙම තොරතුරු මගින් දිසා ලියාපදිංචි කිරීමේ ද්වාරය (Portal) වෙත ප්‍රවේශ වීමට හැකිය.

### 2. ලියාපදිංචි තොරතුරු ජාතික මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම

***ලියාපදිංචි කිරීමේ දී පහත ක්‍රමවේදය අනුගමනය කිරීමට කටයුතු කරන්න.***

බාලදක්ෂයන්ගේ තොරතුරු ඇතුළත් කරමින් මේ සමඟ අමුණා ඇති ජම්බෝරි ලියාපදිංචි කිරීමේ Excel ආකෘති පත්‍රය පිරවිය යුතු ය. (Excel ආකෘතිය ලියාපදිංචි කිරීමේ දිසා නිලධාරී වෙත යොමු කරනු ලැබේ.)

ඉහත ලබාගත් තොරතුරු ඇසුරෙන් මාර්ගගත අයදුම් පත්‍රය ජම්බෝරි ලියාපදිංචි කිරීමේ ද්වාරය (Portal) හරහා පිරවීමට කටයුතු කරන්න. (*මේ සඳහා පුහුණු සැසියක් පැවැත්වේ.)*

සම්පූර්ණ කරන ලද හා සියලුම තොරතුරු නිවැරදි බව තහවුරු කරගත් Excel පත්‍රිකාව 2026 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර **register@jamboree.scout.lk යන ඊමේල් ලිපිනයට** ඊමේල් හරහා ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු අතර එම ලේඛනයට අදාළ සියලු මාර්ගගත ලියාපදිංචි කිරීම් ද 2026 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර අවසන් කළ යුතුය.

*දිසා ලියාපදිංචි කිරීම් විශාල සංඛ්‍යාවක් පවතී නම් විකල්ප ලියාපදිංචි කිරීමේ ගිණුම් ලබාගත හැකි අතර ඒ සඳහා 11වන ජාතික ජම්බොරියේ ලියාපදිංචිය භාර කමිටුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කළ යුතුය.*

### 3. ජම්බෝරි පරිගණක හෝ ජංගම දුරකථන යෙදුම් ප්‍රවේශය "jamX" තුලින් (App) බාලදක්ෂ ගිණුමක් (Scout Account) නිර්මාණය කිරීම

පරිගණක හෝ ජංගම දුරකථන යෙදුම් මාර්ගගත ප්‍රවේශය භාවිතා කරමින් ලියාපදිංචි කිරීමේ පද්ධතිය, ලියාපදිංචි කළ එක් එක් බාලදක්ෂයා සඳහා ගිණුමක් නිර්මාණය කළ යුතුය.

### 4. QR කේතය සහ මුර පදය

බාලදක්ෂ ගිණුමක් නිර්මාණය කළ පසු, එක් එක් බාලදක්ෂයා සඳහා ස්වයංක්‍රීයව ලැබෙන QR කේතය හා මුරපදය (ඉලක්කම් 10 කින් යුතු ය) අදාළ බාලදක්ෂයාට ලබා දිය යුතුය.

### 5. බාලදක්ෂ ජම්බෝරිය සඳහා බාලදක්ෂ ලියාපදිංචිය

මූලික ලියාපදිංචිය සිදු කළ සෑම බාලදක්ෂයෙකු ම https://jamboree.scout.lk ඔස්සේ ලබා දී ඇති QR කේතය (Participant code), උපන් දිනය (Date of Birth) හා මුරපදය (OTP) භාවිතයෙන් ලියාපදිංචිය


65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk

සම්පූර්ණ කළ යුතුය. මෙහිදී විද්‍යුත් තැපැල (Email) හෝ ගූගල් ගිණුම (Google Account) හරහා පෞද්ගලික ගිණුමට ප්‍රවේශ විය හැකිය.

### 6. බාලදක්ෂ තොරතුරු සම්පූර්ණ කිරීම

පෞද්ගලික ගිණුමට ප්‍රවේශ වීමෙන් පසුව සිදු කළ යුතුය.


- ඔවුන්ගේ පුද්ගලික තොරතුරු සනාථ කිරීම
- නිශ්චිත කාල සීමාවට පෙර අවශ්‍ය සියලුම තොරතුරු සම්පූර්ණ කිරීම (2026 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර)

### 7. ජම්බෝරි ලියාපදිංචි ගාස්තු ගෙවීම

ලියාපදිංචිය සම්පූර්ණ කිරීමෙන් පසු (2026 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර), ලියාපදිංචි වූ සහභාගිවන්නන් සංඛ්‍යාව මත පදනම්ව, ගෙවීමට ඇති සම්පූර්ණ ලියාපදිංචි ගාස්තුව එක් කුවිතාන්සියක් ලෙස 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරියේ ලියාපදිංචි කිරීමේ කමිටුව දිසාවන් වලට යොමු කරනු ලැබේ. එහි දී අදාල කාල සීමාව තුළ එම ගාස්තුව ගෙවීමට අදාළ දිසාව කටයුතු කළ යුතුය.

### ජම්බෝරි පරිගණක හෝ ජංගම දුරකථන යෙදුම් ප්‍රවේශය බාවිතා කරන ආකාරය


**පියවර : 1.** දිසා පිවිසුම





**පියවර : 2.** පද්ධතියට පිවිසීමෙන් පසු, දිසා නිලධාරීන්ව එක් කරන්න.




65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk




**පියවර : 3.** ඔබේ දිසාවට කණ්ඩායම් හෝ පාසල් එක් කරන්න.





**පියවර : 4.** ඔබ විසින් එකතු කරන ලද කණ්ඩායම් ලැයිස්තුවට අදාළ මෙම ප්‍රවේශ හැඳුනුම්පත (Access ID) සහ මුරපදය (Password) ඔබේ දිසා බාලදක්ෂ නායකයා වෙත ද යොමු කරන්න.





**පියවර : 5.** ඔබේ බාලදක්ෂයින් සහ නායකයින් ඇතුළත් කිරීමට කණ්ඩායම් පිවිසුම (Troop Login) භාවිතා කරන්න. ප්‍රවේශ හැඳුනුම්පත (Access ID) සහ මුරපදය (Password) භාවිතයෙන් පිවිසෙන්න.




65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka  +94 112 433 131 / 512  info@jamboree.scout.lk  jamboree.scout.lk





**පියවර : 6.** ඔබේ බාලදක්ෂයින් ලියාපදිංචි කරන්න. එක් එක් බාලදක්ෂයා සඳහා QR කේතයක් ලැබෙනු ඇත. එම QR කේතය බාගත කර, අදාළ බාලදක්ෂයාගේ ජම්බෝරි (Jamboree) ක්‍රියාකාරකම් අත් පොතේ (Passport) අලවන්න.





**පියවර : 7.** ලියාපදිංචි වූ සෑම බාලදක්ෂයෙකු සඳහාම එක් වරක් පමණක් සක්‍රිය කිරීමේ OTP අංකයක් ස්වයංක්‍රීයව ජනනය වේ. මෙම OTP අංකය බාලදක්ෂ ගිණුම් සක්‍රිය කිරීමේ ක්‍රියාවලිය සඳහා භාවිතා කරන අතර ලියාපදිංචි ලැයිස්තුවේ පෙන්වනු ලැබේ.




**පියවර : 8.** මෙය ඔබගේ ලියාපදිංචි බාලදක්ෂයින්ගේ ලැයිස්තුවයි. මෙම ලැයිස්තුව තුළ ඔබට එක් එක් බාලදක්ෂයාගේ විස්තර, QR කේතය සහ සක්‍රීය කිරීමේ OTP අංකය (Activation OTP) දැකගත හැකිය. එමෙන්ම, ඔබට බාලදක්ෂයින්ගේ විස්තර සංස්කරණය කිරීමටත්, ලියාපදිංචියක් ඉවත් කිරීමටත්, බාලදක්ෂයාගේ ජම්බෝරි (Jamboree) ක්‍රියාකාරකම් අත් පොතේ (passport) ඇලවීම සඳහා QR කේතය බාගත කිරීමටත් හැකියාව ඇත.





**පියවර : 9.** ඒකක නායකයින් එක් කරන්න. එක් එක් ඒකකය සඳහා බාලදක්ෂයන් 50 දෙනෙකු බැගින් වෙන් කරනු ලැබේ. එක් ඒකකයක අවම වශයෙන් නායකයින් 2 දෙනෙකු හෝ උපරිම වශයෙන් නායකයින් 5 දෙනෙකු සිටිය යුතුය.





**පියවර : 10.** මෙය ඔබගේ ලියාපදිංචි ඒකක නායකයින්ගේ (Unit Leaders) ලැයිස්තුවයි. මෙම ලැයිස්තුව තුළ ඔබට එක් එක් නායකයාගේ විස්තර, QR කේතය සහ සක්‍රීය කිරීමේ OTP අංකය (Activation OTP) දැකගත හැකිය. එමෙන් ම, ඔබට නායකයාගේ විස්තර සංස්කරණය කිරීමටත්, ලියාපදිංචියක් ඉවත් කිරීමටත්, සක්‍රීය කිරීමේ OTP අංකය භාවිතයෙන් නායකයාගේ ගිණුම සක්‍රීය කිරීමටත් හැකියාව ඇත.




**පියවර : 11.** මෙය එක් එක් කණ්ඩායම (troop) සඳහා වන ලියාපදිංචි ගාස්තු සාරාංශයයි. ඔබට ලියාපදිංචි කිරීමේ ඉන්වොයිසිය (PDF) බාගත කර, එහි සඳහන් බැංකු ගිණුමට අදාළ මුදල බැර කළ හැකි අතර, ගෙවීම් ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා ගෙවීම් රිසිට්පත මූලස්ථානය වෙත යැවීමට හෝ භාර දීමට හැකිය.




**පියවර : 12.** මෙය ගිණුම සක්‍රීය කිරීම සඳහා වන පිවිසුම් ක්‍රියාවලියයි. බාලදක්ෂයාගේ හෝ නායකයාගේ QR කේතය ඇතුළත් කර සක්‍රීය කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන්න.




**පියවර : 13.** මෙය සක්‍රීය කිරීම තහවුරු කිරීමේ ක්‍රියාවලියයි. අවශ්‍ය විස්තර පුරවා, එක් වරක් පමණක් භාවිතා කළ හැකි සක්‍රීය කිරීමේ OTP අංකය (One-Time Activation OTP) ඇතුළත් කර, ඉතිරි තොරතුරු සම්පූර්ණ කරන්න. තහවුරු කිරීමෙන් පසු, ඔබේ ගිණුම සක්‍රීය කිරීමේ ක්‍රියාවලිය අවසන් වනු ඇත. ගිණුම සක්‍රීය වූ පසු, ඔබට Jamboree යෙදුමට (App) පිවිස ඔබේ ප්‍රගතිය, Jamboree ක්‍රියාකාරකම් සහ ඒ ආශ්‍රිත වෙනත් විස්තර නැරඹිය හැකිය.



**11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය 2027 - පෝතක බාලදක්ෂ වික්‍රමාන්විත දිනය (Cub Scout Adventure Day)**

දිවයින පුරා සිටින පෝතක බාලදක්ෂයින්ට සුවිශේෂී බාලදක්ෂ අත්දැකීමක් ලබා දීම සඳහා, 2027 ජනවාරි 20 සහ 21 යන දිනවල පෙ .ව.8.00 සිට ප .ව.4.00 දක්වා හෝමාගම, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ දී පෝතක බාලදක්ෂ වික්‍රමාන්විත දින **(Cub Scout Adventure Day)** වැඩසටහන පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මෙම වැඩසටහන සඳහා තම දිසාවේ පෝතක බාලදක්ෂයින් ලියාපදිංචි කිරීමට අපේක්ෂා කරන දිසා බාලදක්ෂ සංගම් 2026 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කළ යුතුය.

## දිසා කණ්ඩායම් ලියාපදිංචිය

### පෝතක බාලදක්ෂ අංශය

- **සහභාගී වන්නන්ගේ වයස:** සුදුසුකම්ලත් පෝතක බාලදක්ෂයින් 2026 සැප්තැම්බර් 30 දින වන විට වයස අවුරුදු 11 නොඉක්මවිය යුතුය.
- **සුදුසුකම්:** 2026 සැප්තැම්බර් 30 වන දිනට පෙර 'ලෝකඩ තරු ප්‍රදානය' (Bronze Star Award) සම්පූර්ණ කර ඇති පෝතක බාලදක්ෂයින් ඕනෑම සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීමට දිසා වලට හැකියාව ඇත.
- **බාලදක්ෂ නායකයින්:** පෝතක බාලදක්ෂයන් 5 දෙනෙකු සඳහා අවම වශයෙන් එක් පෝතක බාලදක්ෂ නායකයෙකු හෝ එක් දෙමාපිය සම්බන්ධීකාරකවරයෙකු දිසාව විසින් පත් කර ලියාපදිංචි කළ යුතුය.

### ලියාපදිංචිය සහ ගාස්තු

- **ලියාපදිංචි ගාස්තුව:** රුපියල් 1,000 කි. (පෝතක බාලදක්ෂයින්, පෝතක බාලදක්ෂ නායකයින් සහ දෙමාපිය සම්බන්ධිකාරකවරුන් සඳහා).
- **ලියාපදිංචියේ දී හිමිවන දේ:** තෝරාගත් එක් දිනකදී (2027 ජනවාරි 20 හෝ 21 යන දින වලින් එකක) පැවැත්වෙන 'පෝතක බාලදක්ෂ වික්‍රමාන්විත දිනය (*Cub Scout Adventure Day*) වැඩසටහනට සහභාගී වීමේ අවස්ථාව, නිල ක්‍රියාකාරකම් කාඩ්පත (*Official Activity Card*), සහභාගීත්ව සහතිකපත්‍රය සහ ජම්බෝරි පදක්කම (*badge*) ලැබෙනු ඇත.
- **ගෙවීම් ක්‍රියාවලිය:** උපදෙස්වලට අනුකූලව ලියාපදිංචිය සම්පූර්ණ කිරීමෙන් පසු ගෙවීමට ඇති සම්පූර්ණ ලියාපදිංචි ගාස්තුව එක් කුවිතාන්සියක් ලෙස දිසා වලට යොමු කරනු ලැබේ. මෙම ලියාපදිංචි ***මුදල පාසල් සංවර්ධන සමිති අරමුදල හෝ සමූහ ආධාර කමිටුව මගින්*** ලබාගැනීමට දිසා වලින් කටයුතු කළ යුතුය.

### ලියාපදිංචි වීමේ උපදෙස්

ලියාපදිංචි වීමට පෙර පහත උපදෙස් හොඳින් කියවා ලියාපදිංචිය සිදු කිරීමට කටයුතු කරන්න.



65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk

**ලියාපදිංචි කිරීම**

ලියාපදිංචි කිරීමේ දිසා නිලධාරී හරහා පෝතක බාලදක්ෂයන්ගේ තොරතුරු ඇතුළත් කරමින් මේ සමඟ අමුණා ඇති ජම්බෝරී ලියාපදිංචි කිරීමේ Excel පත්‍රිකාවේ ආකෘති පත්‍රය පිරවිය යුතු ය. (Excel ආකෘතිය ලියාපදිංචි කිරීමේ දිසා නිලධාරී වෙත යොමු කරනු ලැබේ.)

**ලියාපදිංචි තොරතුරු ජාතික මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම**

සම්පූර්ණ කරන ලද හා සියලුම තොරතුරු නිවැරදි බව තහවුරු කරගත් Excel පත්‍රිකාව 2026 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර **register@jamboree.scout.lk යන ඊමේල් ලිපිනය ට** ඊමේල් හරහා ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත ඉදිරිපත් කළ යුතුය.

**ජම්බෝරී ලියාපදිංචි ගාස්තු ගෙවීම**

ලියාපදිංචිය සම්පූර්ණ කිරීමෙන් පසු (2026 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර), ලියාපදිංචි වූ සහභාගී වන්නන් සංඛ්‍යාව මත පදනම්ව, ගෙවීමට ඇති සම්පූර්ණ ලියාපදිංචි ගාස්තුව එක් කුවිතාන්සියක් ලෙස 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරියේ ලියාපදිංචි කිරීමේ කමිටුව දිසා වලට යොමු කරනු ලැබේ. එහිදී අදාල කාල සීමාව තුළ එම ගාස්තුව ගෙවීමට දිසාව විසින් කටයුතු කළ යුතුය.

මෙම උද්යෝගිමත් ජාතික වැඩසටහනට සහභාගී වී වික්‍රමාන්විත බව, නව ඉගෙනුම් අවස්ථා, මිත්‍රත්වය සහ බාලදක්ෂ ව්‍යාපාරයේ සැබෑ අත්දැකීම් අත්විඳින දිනයක් ගත කිරීමට සියලුම පෝතක බාලදක්ෂයන්ට (සුදුසුකම් ලත් ) අපි ආරාධනා කරන්නෙමු.

## ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ 3 වන ජාතික කිඩෝරී (3rd National Kiddoree) වැඩසටහන

3 වන ජාතික කිඩෝරී වැඩසටහන 11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය හි සමගාමී වැඩසටහනක් ලෙස 2027 ජනවාරි 19 වන දින හෝමාගම, දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. කිඩෝරී වැඩසටහන සඳහා ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය පෙර නිකුත් කරන ලද ජාතික කිඩෝරී චක්‍රලේඛයට අනුකූලව සිදු කෙරෙන අතර එම චක්‍රලේඛයේ දක්වා ඇති උපදෙස් අනුගමනය කරන ලෙස සියලුම සහභාගී වන්නන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

**ජම්බෝරී සේවා කණ්ඩායම (JST)**

ජම්බෝරී සේවා කණ්ඩායමේ (JST) සාමාජිකයන් ලෙස සේවය කිරීමට කැමති ජනාධිපති බාලදක්ෂයන්, මානවක බාලදක්ෂයන් හා වැඩිහිටි නායකයින් තම අදාළ දිසා කොමසාරිස්වරුන් හරහා අයදුම් කළ හැකිය.

***වැඩිහිටි නායකයින් ජාතික බාලදක්ෂ මූලස්ථානය මගින් නිකුත් කළ බලපත්‍ර ලිපියක්, අධිකාරී පත්‍රයක් හෝ ජාතික පුහුණු කිරීමේ මණ්ඩලය මගින් නිකුත් කළ රාජකාරි පැවරීමේ ලිපියක් තිබීම අනිවාර්යවේ.***

- **වයස් අවශ්‍යතාවය:** **2027 ජනවාරි** 17 වන විට වයස **අවුරුදු 18** හෝ ඊට වැඩි අය විය යුතුය.
- **සුදුසුකම්:** අයදුම්පත අදාළ දිසා කොමසාරිස්වරයා විසින් නිර්දේශ කර අනුමත කළ යුතුය.

**ලියාපදිංචිය සහ ගාස්තු**


65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka +94 112 433 131 / 512 info@jamboree.scout.lk jamboree.scout.lk

- **ලියාපදිංචි ගාස්තුව:** රුපියල් 2,500කි.
- **ලියාපදිංචියේ දී හිමිවන දේ:** නිල ජම්බෝරි සේවා කණ්ඩායම් ඇඳුම් කට්ටලය, සේවා කාලය තුළ ආහාර, ජම්බෝරි යොවුන් කඳවුරේ නවාතැන් පහසුකම්, සහභාගීත්ව සහතික පත්‍රය, ජම්බෝරි පදක්කම (Badge) ලැබෙනු ඇත.
- **ගෙවීම් ක්‍රියාවලිය:** උපදෙස් වලට අනුකූලව ලියාපදිංචිය සම්පූර්ණ කර අදාල පරිදි ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතුය.
- ඉහත අවශ්‍යතාවන් සපුරාලන ඕනෑම සමාජික සංඛ්‍යාවකට ජම්බෝරි සේවා කණ්ඩායම (JST) සඳහා ලියාපදිංචි විය හැකිය.

## ලියාපදිංචි වීමේ උපදෙස්

ලියාපදිංචි වීමට පෙර පහත උපදෙස් හොඳින් කියවා ලියාපදිංචිය සිදු කිරීමට කටයුතු කරන්න.

## ලියාපදිංචි කිරීම

**Download link** – http://jamboree.scout.lk/JST_Application වෙතින් JST අයදුම්පත බාගත කර, අදාළ දිසා කොමසාරිස්වරයාගේ නිර්දේශය සහ අනුමැතිය සහිතව සම්පූර්ණ කළ යුතුය.

## ජම්බෝරි ලියාපදිංචි ගාස්තු ගෙවීම

අදාල ගාස්තුව **2026 සැප්තැම්බර් 30** වන දින හෝ ඊට පෙර අයදුම්පතෙහි සඳහන් පරිදි ශ්‍රී ලංකා ජාතික බාලදක්ෂ මූලස්ථානයේ ගිණුමට තැන්පත් කිරීම සිදු කළ යුතුය.

## ලියාපදිංචි තොරතුරු ජාතික මූලස්ථානය වෙත ඉදිරිපත් කිරීම

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත හා ලියාපදිංචි ගාස්තු ගෙවන ලද රිසිට් පත සමගින් **2026 සැප්තැම්බර් 30** වන දින හෝ ඊට පෙර jst@jamboree.scout.lk **යන ඊමේල් ලිපිනය ට** ඊමේල් හරහා ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය.

***ජම්බෝරි සේවා කණ්ඩායම් සාමාජිකයින් සඳහා යොමු කර ඇති අයදුම්පත් සහ මෙහෙයුම් අවශ්‍යතා සමාලෝචනය කිරීමෙන් පසු, 2026 ඔක්තෝබර් තුන්වන සතිය වන විට ජම්බෝරි සේවා කණ්ඩායම් සාමාජිකයින් අදාළ අංශ වෙත අනුයුක්ත කෙරේ.***

## ජම්බෝරිය අතරතුර හානියෙන් සුරක්ෂාව (Safe from Harm)

11 වන ජාතික බාලදක්ෂ ජම්බෝරිය පුරා සියලුම සහභාගිවන්නන් සඳහා ආරක්ෂිත පරිසරයක් ඇතිකරලීමට ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය කැපවී සිටියි.

ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ හානියෙන් සුරක්ෂාව ප්‍රතිපත්තියට **(Safe from Harm)** අනුකූලව, වයස අවුරුදු 18 සහ ඊට වැඩි සියලුම සහභාගිවන්නන් සහ නායකයින් ජම්බෝරියට පෙර හානියෙන් සුරක්ෂාව **(Safe from Harm)** මාර්ගගත පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීම අනිවාර්ය වේ. **(www.scout.edu.lk)**

මේ පිළිබඳ විස්තරාත්මක චක්‍රලේඛයක් ඉදිරියේ දී නිකුත් කරනු ඇත. මෙහිදී සියලුම දිසා කොමසාරිස්වරුන්ගේ සහ නායකයින්ගේ සහයෝගය බෙහෙවින් අගය කරනු ලැබේ.

ජම්බෝරියට සහභාගී වන සෑම සහභාගිවන්නෙකුටම ආරක්ෂිත සහ ධනාත්මක පරිසරයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය බැවින්, මෙම අවශ්‍යතාවයට අනුකූල වීම සහතික කිරීමේ දී සියලුම දිසා කොමසාරිස්වරුන්ගේ සහ නායකයින් සහයෝගය බෙහෙවින් අගය කරනු ලැබේ.



65/9, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02, Sri Lanka  +94 112 433 131 / 512  info@jamboree.scout.lk  jamboree.scout.lk